- "දුවේ පුතේ"

නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

* ඉතා . . . . . . දුවගෙන ගිය නිපුන් තරගයේ පළමුවැනියා විය.
* තරගයේ අන්තිමයා වූයේ . . . . . . දුවගෙන ගිය තාරක ය.

(සෙමෙන් - වේගයෙන්)

* වලස් අයියා හරි ම . . . . . . . යි.
* වලස් මල්ලී හරි ම . . . . . . . . යි.

(කීකරු - අකීකරු)

* විභාගයට . . . . . . . දහයක් තිබිණි.
* ඒවාට . . . . . . . ලිවීම ඉතා පහසු විය.

(ප්‍රශ්න - පිළිතුරු)

* . . . . . . . . . . රූපයට වචනය යා කරන්න.
* . . . . . . . . . . වචනය කපා හරින්න.

(ගැළපෙන - නොගැළපෙන)

* වලස් අයියා . . . . . . . . තැනකින් නැවේ ය.
* වලස් මල්ලි . . . . . . . . තැනකින් නැවේ ය.

(පුරුදු - නුපුරුදු)

**හොඳ දරුවෝ**

ඇත කඳුකර ප්‍රදේශයක තිබුණු සුන්දර ගමක පුංචි පවුලක් ජීවත් වුණා. අම්මා, තාත්තා, දුව සහ පුතා මේ පවුලේ සාමාජිකයෝ. පුතාගේ නම මලිත්. දුව මලිති. මලිත් සහ මලිති ඉතා ම හොඳ ගති පැවතුම් ඇති ළමයි දෙදෙනෙක්. අම්මා සමඟ **ගමන් බිමන්** යන්න මේ දෙන්නා හරි ම ආසයි. ඒ යන අතරමඟ දී හමුවන **අහල පහල** අය සමඟ මොවුන් සුහද ව **කතා බහ** කරනවා. ගමේ හැම දෙනා ම මේ දරුවන් දෙන්නාට හරි ම ආදරෙයි. අපේ **සිරිත් විරිත්**වලට ගරු කරන, දෙමවුපියන්ට කීකරු වී හැදෙන ළමයි දෙදෙනෙක් කියලා ගමේ කවුරුත් කතාබහ කළා. මේ දරුවන්ගේ හොඳ ගතිගුණවලට පැහැදුණු ගමේ සමහර අය ඔවුන්ට **තෑගි බෝග** පවා රැගෙන ගෙදරට අවා. එසේ පැමිණෙන අයට **කෑම බීම** වලින් සංග්‍රහ කරනන් මේ ගෙදර අය අමතක කළේ නැහැ. මේ දරුවෝ දෙන්නා ඉගෙනීමටත් දක්ෂ යි. පාසලේ බාහිර වැඩ කටයුතුවල දී ද මොවුන් කැපී පෙනෙන අයුරින් කටයුතු කරනවා.

- ඉහත ඡේදය ශබ්ද නගා කියවන්න.
- එහි තද කළු අකුරෙන් යටින් ඉරි ඇඳි පද නැවත ශබ්ද නගා කියවන්න.

පහත එම වචන නැවත ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

- මෙම වචන වලට යුගල පද කියලා තමයි කියන්නේ